බිංගිරිය ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 අප්‍රේල් 03 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බිංගිරිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

#### 1.3.1 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාග්ධන ආධාර රු.1,000,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවියයුතු රු.3,186,156 ක් වූ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල රු.3,548,578 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.13,813,750 ක් වූ විවිධ ණයහිමියන් රු.24,353,365 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) රු.326,136 ක් වූ ඉදිරි ගෙවීම් සහ රු.122,927 ක් වූ වර්ෂයට අදාළ වියදම් එකිනෙකට මාරුකර ගිණුම්ගත කර තිබුණි.

(ඉ) රු. 6,429,375 ක් වූ මෝටර් ග්‍රේඩරය සහ රු.276,000 ක් වූ ගාබේජ් ට්‍රේලරය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඊ) ලිබඩු හා සවි කිරීම් රු.182,385 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු රු.8,400 ක් වූ ව්‍යාපාර බදු රු.46,800 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.150,745,629 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල රු.155,745,629 ක් ලෙස දක්වා තිබුණි.

**1.3.3** <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.188,936,704 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා අදාළ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.17,314,853 ක නොසැසඳීම් පැවතුණි.

**1.3.4** <u>අවිනිශ්චිත ගිණුම්</u>

2016 ජනවාරි 01 දිනට රු.1,539,706 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය 2016 දෙසැම්බර් 31 දිනට රු.7 ,411,282 ක හර ශේෂයක් වී තිබුණි.

**1.3.5** <u>ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.58,653,000 ක් වූ ලැබියයුතු ගිණුම්වලින් රු.14,746,596 ක් වර්ෂ 03 ට වැඩි කාලයක සිට හිඟව පවතින අතර, අයකර ගැනීමේ කටයුතු දුර්වල තත්වයක පැවතුණි.

(ආ) රු.1,407,026 ක අත්තිකාරම් ශේෂයක් වර්ෂ 05 ඉක්මවූ කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 46,554,379 ක් වූ ගෙවියයුතු ගිණුම්වලින් රු.38,417,376 ක් වසර 03 ක් ඉක්මවූ කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

**1.3.6** <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

එකතු වටිනාකම රු.122,173,462 ක් වූ ගිණුම් විෂයයන් 07 කට අදාළ විස්තරාත්මක උපලේඛන, ශේෂ සනාථ කිරීම් සහ සැසඳීම් වාර්තා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම විෂයයන් පිළිබඳව සතුටුදායක පරීක්ෂාවක් කළ නොහැකි විය.

## 02 <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.21,015,363 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.6,035,048 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,980,315 ක වර්ධනයක් සිදු වී තිබුණි.

### 2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

මුළු මෙහෙයුම් ආදායම රු.17,292,191 කින් වැඩිවීම  මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.3 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.3.1 <u>ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය</u>

රුපියල් මිලියන 92.6 ක් වූ ඇස්තමේන්තුගත ආදායමෙන් රුපියල් මිලියන 89.6 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31  දිනට රුපියල් මිලියන 29.6 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 57 ක් දක්වා වැඩි වී තිබුණි.

#### 2.3.2 <u>බදු කුලී</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අවම ලංසුව රු.655,830 ක් වූ මස්කඩ 05 ක් හා පොල් එළදා ඉඩම් 06 ක් වසර ගණනාවක් තිස්සේ බදුදීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වෙළඳ අයිතිය බදු දීමට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට රු.322,118 ක් හිඟව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට බදු දුන් වත්කම් 03 ක හිඟ වාරික ආරක්ෂිත ඇපවලට හිලව් කර තිබුණද, ප්‍රමාදවීම් වෙනුවෙන් රු.18,514 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වත්කම් බදු දීම් 04 ක් වෙනුවෙන් රු.550,159 ක හිඟ බදුකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3** **<u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට උසාවි දඩ රු.11,500,000 ක් සහ මුද්දර ගාස්තු රු.12,943,672 ක් අයවීමට තිබුණි.

**03.** **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1** **<u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට එකතුව රු.1,001,767 ක් වූ බැංකු ගිණුම් 02 ක් අක්‍රියව පැවති අතර, මෙම ගිණුම් පිළිබඳ විස්තර සභාවේ ලේඛන මඟින් ද හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අංක PF – 3337 කැබ් රථය සභා පරිශ්‍රයෙන් පිටවීමට හා පැමිණීමට අදාළ විස්තර දෛනික වාහන පිටවීමේ සහ පැමිණීමේ ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඇ) සභාව සතු වාහන 06 ක මයිලෝ මීටර් 2016 සැප්තැම්බර් 05 වන දින පෙරවරු 9.00 ට භෞතිකව පරීක්ෂා කිරීමේදී මීටරය හා ධාවන සටහන්වල සඳහන් කර තිබෙන දුර ප්‍රමාණයන් අතර කි.මී 11 සිට 348 දක්වා වෙනස්කම් පැවතුණි.

(ඈ) බැංකු සැසඳුම් අනුව රු.181,846 ක් වූ හඳුනා නොගත් වෙනසක් වර්ෂය තුළ නිවැරදි කර නොතිබුණි.

**3.2** **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

ඉඩම් කට්ටි කර විකිණීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඉඩම් කට්ටි කර විකිණීමේ අතුරු ව්‍යවස්ථා අනුව කට්ටි කරන ඉඩම්වල අභ්‍යන්තර මාර්ගවල පළල අඩි 30 ක් වෙනුවට අඩි 20 ක් හා විවිධ අඩුපාඩු පැවතීම හේතුවෙන් ඉඩම් කට්ටි මිලදී ගනු ලැබූ පුද්ගලයින්ට වීථිරේඛා සහතික ලබාගත නොහැකි වී තිබුණි.

(ආ) තල්ගහමුලහේන ඉඩමේ කට්ටි සැලැස්මෙන් පර්චස් 24.2 ක් ඉවත් කිරීම හේතුවෙන් ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.978 ක් වීමෙන් පොදු පහසුකම් සඳහා සභාවට ලැබියයුතු පර්චස් 35.42 ක ප්‍රමාණයක් අහිමි වී තිබුණි.

(ඇ) තල්ගහමුල හේන ඉඩමේ කට්ටි සැලැස්ම අනුමත කිරීමේදී ජල පහසුකම් ලබාදී තිබේද යන්න සහ මාර්ග නියමිත පළලින් යුතුව ඉදිකර තිබේද යන්න පරීක්ෂා කර නොතිබුණි.

(ඈ) අක්කර 01 රූඩ් 01 පර්චස් 33 ක් වූ දළුපොත ගොඩනැගිල්ලේ වත්ත ඉඩමේ විකුණුම් වටිනාකම මත සභාවට විකුණුම් බදු ලබා ගන්නවා වෙනුවට විවිධ ඇස්තමේන්තුවල මිල ගණන් මත එම මුදල ලබාගෙන තිබුණි.

### 3.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) උපදේශන ඉංජිනේරු දීමනා ගෙවීම් ගණනය කිරීමේදී පරිපාලන වියදම්, විදුලි වියදම්, උපදේශන වියදම්, බදු සහ අසම්භාව්‍යතාවයන් වෙනුවෙන් වූ රු.3,923,447 ක් සැලකිල්ලට ගෙන රු.108,852 ක උපදේශන දීමනා වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) අංක GC-4267 දරන ටිපර් රථය, 2014 වර්ෂයේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියේ හා චක්‍රලේඛ උපදෙස්වලින් බැහැරව අළුත්වැඩියාවන් සඳහා පෞද්ගලික ගරාජයක් වෙත ලබාදී 2017 අප්‍රේල් 06 දින රු. 2,064,200 ක් ගෙවා තිබුණු අතර අදාළ අළුත්වැඩියාව සඳහා වසර 03 ක කාලයක් ගතවී තිබුණි.

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.510,874 ක ඇස්තමේන්තුවකින් හල්මිල්ලවැව කායවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ඉදි කිරීම් 2016 සැප්තැම්බර් 09 දින පරීක්ෂාවට අනුව යොදාගෙන තිබූ බ්ලොග් ගල් ප්‍රමිතියෙන් තොර ඒවා වීම, හැඩයම් නිමාව ඉතා දුර්වල තත්ත්වයක පැවතීම හා බිම් එක අඩි 04 පමණ කොටසක් ඇද වී කොන්ක්‍රීට් පුපුරා තිබීම නිසා බිත්තියට සම්බන්ධ වන ස්ථානවලින් කම්බි මතු වී තිබුණි. මේ අනුව ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ආ) රු.5,153,415 ක වටිනාකමින් යුත් බිංගිරිය බස් නැවතුම්පල බිම් මහළ ඉදි කිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් ලංසු ලබා ගැනීම සඳහා සුදුසුකම් නොතිබුණු කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ටෙන්ඩර් ආකෘතිපත් නිකුත් කර තිබුණි.

### 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

බිංගිරිය ප්‍රාදේශීය සභාව විසින් මාසිකව එකතු කරන කසළ ටොන් 170 කින් ටොන් 45 ක් පමණ පොහොර සැකසීම සඳහා යොදා ගනු ලබන අතර ඉතිරිය ප්‍රතිචක්‍රියකරණය කළ හැකි කඩදාසි, පොලිතීන්, වීදුරු වැනි අනෙකුත් දෑ වලින් සමන්විත විය. 2016 වර්ෂයේදී පොහොර කි.ග්‍රෑම් 13,230 ක් නිෂ්පාදනය කර තිබුණු අතර ඉන් කි.ග්‍රෑම් 12,080 ක් අලෙවි කර රු.96,640 ක් උපයා තිබුණි.

## 04. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වැඩ විෂයයන් 10 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් සියයට 48 සිට සියයට 100 ක් දක්වා ඉතිරි වීම් පැවතුණි.

(ආ) මහජන ඉල්ලීම් පදනම් කරගත් ව්‍යාපෘති 44 න් රු.240,000 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 24 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

(ඇ) වෛද්‍යාධාර සඳහා වෙන්කර තිබූ රු.300,000 න් රු.290,000 ක් ඉතිරි වී තිබීම නිසා ඉන් රු.250,000 ක් වෙනත් වැය විෂයකට මාරු කර තිබුණි. ඉකුත් වර්ෂයේ ද අදාළ ප්‍රතිපාදන අරමුණුගතව යොදවා නොතිබුණි.

## 05. පද්ධති හා පාලන

විගණනයේදී අනාවරණය වූ පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳ දුර්වලතාවයන් වරින් වර මාගේ විගණන විමසුම් මගින් ප්‍රාදේශීය සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | පද්ධතියේ අඩුපාඩු |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ශේෂ කපා හැරීම් හා නිවැරදි කිරීම් නිශ්චිත හේතු සමග වෙන්කර හඳුනා නොගැනීම.<br>ii. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් නොකිරීම (මුදල් පදනම)<br>iii. උපලේඛන මගින් තහවුරු කිරීම් නොතිබීම. (ආදායම් ණයගැති කොටසක්) |
| (ආ) නිවාස දේපල සංවර්ධනය කර විකිණීම | අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ජල පහසුකම්, විදුලි පහසුකම් හා අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ නොවීම. |
| (ඇ) ආදායම් | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) කසළ කළමනාකරණය | කාබනික පොහොර ඉල්ලුම සපුරාලීමට ක්‍රියාමාර්ග නොගැනීම. |